**මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය - සංරචක 01 - 2024**

------------------------------------------------------------------------------------------------

මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය - සංරචක 01 හි 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2024 ජනවාරි 31 දින එළඹි අංක 7418-LK දරන ණය ගිවිසුමේ විධිවිධානයන් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ අරමුදල නමින් ක්‍රියා කරන ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.
තැන්පතු රක්ෂණ ක්‍රමය කෙරෙහි අවධානය යොමු කරමින්, ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ ආරක්ෂක ජාලයේ මූල්‍ය හා ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ.
සංරචක 01, සංරචක 02 සහ සංරචක 03 යන සංරචක තුනක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.
ණය ගිවිසුමට අනුව, සංරචකය 1 සඳහා වෙන් කර ඇති මුදල ඇමරිකානු ඩොලර් මිලියන 146 ක් වන අතර එය රුපියල් මිලියන 46,342 කට සමාන වන අතර සම්පූර්ණ මුදල ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි.
ව්‍යාපෘතියේ කටයුතු 2024 අප්‍රේල් 03 දින ආරම්භ කරන ලද අතර, 2027 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ලැබීම් සහ ගෙවීම් ප්‍රකාශය හා එහි නිර්දේශිත ගිණුමේ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

# 2. භෞතික කාර්යසාධනය

## 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිය මූල්‍යනය කිරීමේ ගිවිසුමෙහි III ඇ(1) වගන්තිය ප්‍රකාරව, කාර්යසාධනය පාදක කරගත් කොන්දේසි (PBCs) සපුරාලීමට පෙර ව්‍යාපෘතියේ 1 කොටස යටතේ සුදුසුකම් ලත් වියදම සඳහා මූල්‍යනය කිරීම ආපසු ලබා ගැනීමට ලබන්නාට | අදහස් දක්වා නොතිබුණි. | කාර්ය සාධනය පාදක කරගත් සියලු කොන්දේසි (PBCs) කාලීනව සපුරාලීම සහතික කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

ඉල්ලීම් කළ හැකි වන්නට නම් ලබන්නා විසින්,
අ) අවසන් දිනයට පෙර එවැනි කාර්යසාධනය පාදක කරගත් කොන්දේසි (PBC )ඉටු කිරීමත්,
ආ) ගෙවීමට නියමිත අවසන් දිනයට පෙර එවැනි කාර්ය සාධනය පාදක කරගත් කොන්දේසි (PBCs) සපුරාලීමට කටයුතු කර ඇති බවට සෑහීමකට පත්විය හැකි සාක්ෂි සංගමය වෙත සැපයීමත් කළ යුතුය.
PBC 5, PBC 6(1) සහ PBC 8 වර්ෂයක් තුළ අවසන් කිරීමට නියමිතව තිබුණද 2025 අගෝස්තු 31 දිනට, ඒවා පිළිවෙලින් සියයට 80 ක්, සියයට 45 ක් සහ සියයට 25 ක් පමණක් අවසන් කර තිබුණි.

## 2.2 මානව සම්පත් කළමනාකරණ ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි (POM) III වගන්තිය ප්‍රකාරව, ලෝක බැංකු ප්‍රසම්පාදන රෙගුලාසිවලට අනුගත වෙමින් සියලු ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධීකරණය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) තැන්පතු රක්ෂණ සහ නිරාකරණ දෙපාර්තමේන්තුව (DIRD) යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයට (PIU) නිර්දේශිත ප්‍රසම්පාදන විශේෂඥයකු ඇතුළත් විය යුතුවීම අවශ්‍ය වේ.කෙසේ වෙතත්, ප්‍රසම්පාදන විශේෂඥවරයා වසරක කොන්ත්‍රාත්තුව අවසන් කිරීමෙන් පසු ඔහුගේ සේවය අවසන් කර ඇති බැවින්, දැනට එම වගකීම මහ බැංකුවේ ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට පවරා තිබුණි. | මූල්‍ය අංශ ආරක්ෂක දැල ශක්තිමත්කරණ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන විශේෂඥවරයාගේ කාර්යභාරය කර ගෙන යාම සඳහා තැන්පතු රක්ෂණ සහ නිරාකරණ දෙපාර්තමේන්තුව (DIRD)හි අභ්‍යන්තර සේවක සාමාජිකයෙකු යොදා ගැනීමට ලෝක බැංකුව එකඟ වී ඇත. | ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි විධිවිධානයන්ට අනුකූල වීමට අවශ්‍ය පියවර ගත යුතුය. |